# නිවැරදිව හා ප්‍රවේසම් සහගතව ප්‍රතිජීවක භාවිත කිරීම සඳහා ඔබ අපට අවශ්‍යයි.

පශු ඖෂධ තොග සහ සිල්ලර බෙදා හරින්නන්

ප්‍රතිජීවක යනු සතුන්ගේ සහ මිනිසුන්ගේ රෝග, ආසාදන තත්ව පාලනය කිරීමට හා ප්‍රතිකාර කිරීමට අත්‍යාවශ්‍ය ඖෂධ වේ.

නමුත් ඒවායේ ක්‍රියාකාරී කාර්යක්ෂමතාව ඉතා ශීඝ්‍රයෙන් පහළ වැටෙමින් පවතී.

## ඔබ දැනගත යුතු දේ

- මෙම වටිනා ඖෂධ නිවැරදි ආකාරයෙන් භාවිත නොකිරීම නිසා, රෝග කාරකයින් ඒවාට එරෙහිව ප්‍රතිරෝධය ගොඩ නඟා ගැනීම ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී. බැක්ටීරියා, ප්‍රතිජීවකවලට ප්‍රතිරෝධී වූ විට, ඒවායේ ක්‍රියාකාරී කාර්යක්ෂමතාව හීන වන අතර ඒවාට තවදුරටත් රෝගවලට එරෙහිව ක්‍රියා කළ නො හැක. ප්‍රතිජීවකවලට ප්‍රතිරෝධීතාවය ලෙස හඳුන්වන්නේ මෙම සංසිද්ධිය යි.
- ප්‍රතිජීවක ප්‍රතිරෝධීතාවය ජලයේ හා ගොඩබිම වාසය කරන සියලුම සතුන්ගේ හා මිනිසුන්ගේ සෞඛ්‍යට හා සුබසාධනයට දැඩි තර්ජනයකි. එමෙන්ම පවත්නා ප්‍රතිජීවකවල ප්‍රතිරෝධිතාව ඉහළ යන ශීඝ්‍රතාවය, නව ප්‍රතිජීවක නිෂ්පාදනය වන ශීඝ්‍රතාවයට වඩා ඉතා ඉහළය. එබැවින් දැනට පවතින ප්‍රතිජීවක ඖෂධ රැකගැනීම ඉතා වැදගත් වී ඇත.
- ලෝක සත්ව සෞඛ්‍ය සංවිධානයේ අන්තර් රාජ්‍ය ප්‍රමිතීන්ට අනුව, මෙම අනර්ඝ ඖෂධ වගකීමෙන් හා නිවැරදි ලෙස භාවිත කිරීමෙන්, මිනිස් හා සත්ව සෞඛ්‍ය රැකගැනීම සඳහා ඒවායේ ක්‍රියාකාරී කාර්යක්ෂමතාව හා පැවැත්ම ආරක්ෂා කර ගත හැක.

**ඔබ අපට අවශ්‍යයි!**

“අප සියලු දෙනා ම කළ යුතු කාර්යයක් ඇත. විශේෂයෙන් ප්‍රතිජීවක බෙදාහරින්නන් ලෙස ඔබට ද මේ සඳහා දායක විය හැක.”



- ප්‍රතිජීවකවල පැවැත්ම හා ක්‍රියාකාරී කාර්යක්ෂමතාව රැකගැනිම සඳහා ඒවායේ නිවැරදි සහ වගකීම් සහගත භාවිතය තහවුරු කළ යුතු අතර, එමගින් මිනිස් හා සත්ව සෞඛ්‍ය මෙන් ම සුබසාධනය ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතු ය. යහපත් සත්ව පාලන ක්‍රමවේද, මනා ජෛව ආරක්ෂණ හා සනීපාරක්ෂණ උපක්‍රම සහ එන්නත් භාවිතය සඳහා ප්‍රමුඛතාවය ලබාදීමෙන් සතුන්ගේ සෞඛ්‍ය තත්වය ඉහළ මට්ටමකින් පවත්වා ගෙන යා හැක.
- රෝග කාරකවල ප්‍රතිජීවක ප්‍රතිරෝධය මැඩලීම ලෝක සත්ව සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමුඛ අරමුණක් වී ඇත. ප්‍රතිජීවක තොග සහ සිල්ලර වෙළඳාමේ නියුතු ඔබ ඇතුළු සියලුම සත්ව සෞඛ්‍ය පිළිබඳ කටයුතු කරන අංශ ලෝක සත්ව සෞඛ්‍ය සංවිධානයේ අන්තර් ජාතික ප්‍රමිතීන්ට අනුව වගකීමෙන් හා නිවැරදි ආකාරයට මෙම ඖෂධ මිනිසුන්ගේ හා සතුන්ගේ සෞඛ්‍ය හා සුබසාධනය ඉහළ නැංවීම උදෙසා භාවිත කරනු දැකීම එම සංවිධානයේ අපේක්ෂාව වේ.

වැඩිදුර තොරතුරු සඳහා : www.oie-antimicrobial.com

# පශු ඖෂධ තොග සහ සිල්ලර වශයෙන් බෙදාහරින්නනි,

## ප්‍රතිජීවකවල ආරක්ෂකයා ඔබයි.

පශු ඖෂධ තොග සහ සිල්ලර බෙදා හරින්නන්

- ප්‍රතිජීවක ඉතා වගකීමෙන් බෙදාහැරිය යුතු ඖෂධ නිසා, ඒවායේ ක්‍රියාකාරී කාර්යක්ෂමතාව සහ පැවැත්ම සංරක්ෂණය පිළිබඳ ඔබ දැනුවත් වීම ඉතා වැදගත් වේ. නිතරම ඉතා උසස් තත්වයේ ප්‍රතිජීවක පශු වෛද්‍යවරයෙකුගේ නිර්දේශය මත පමණක් ම බෙදාහැරීමේ වැදගත්කම පිළිබදව ඔබ හොඳින් දැන සිටිය යුතු ය.
- වගකීම් සහගත හා නිවැරදි ප්‍රතිජීවක භාවිතය, ඒවාට එරෙහිව ගොඩනැගෙන ප්‍රතිරෝධය මැඩ පැවැත්වීමට හා එය ඇතිවීම හා පැතිරීම පාලනය කිරීමට ඉවහල් වන අතර, සත්ව සෞඛ්‍ය හා සුබසාධනය වැඩි දියුණු කිරීමට අවශ්‍ය ප්‍රායෝගික තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීමේ දී ද වැදගත් වේ.
- ප්‍රතිජීවක අලෙවිකරණය හා බෙදාහැරීම ඔබේ වගකීම හා පාලනය යටතේ පවතී. ඔබගේ නායකත්වය ප්‍රතිජීවක ප්‍රතිරෝධීතාවය ජයගැනීමේ අරගලයට ඉතා වැදගත් වන අතර එය මේ ක්ෂේත්‍රය සදහා වන ඔබගේ වෘත්තිමය භාවය හා කැපවීම පිළිබිඹු කරයි.

## පශු ඖෂධ තොග සහ සිල්ලර බෙදාහරින්නන් වශයෙන් ඔබගේ කාර්යභාරය

1. අනුමත ඖෂධ මූලාශ්‍ර පමණක් භාවිත කරන්න.
2. පශු ප්‍රතිජීවක කළමනාකරණයේදී මනා / නිර්දේශිත ගබඩා සහ ප්‍රවාහන තත්වයන් සැම විටම අනුගමනය කරන්න.
3. ලියාපදිංචි පශු වෛද්‍යවරයෙකුගේ වලංගු නිර්දේශ මත පමණක්ම ප්‍රතිජීවක බෙදාහැරීමට ක්‍රියා කරන්න.
4. සියළුම ඖෂධ නිෂ්පාදන නියමිත ආකාරයට ලේබල් කර ඇති බව තහවුරු කරගන්න. (භාවිතයට උපදෙස්, කල් ඉකුත්වීමේ දිනය, සත්ව ශරීරයෙන් ඉවත්වීමේ කාලසීමාව පිළිබදව පැහැදිලි සහ නිවැරදි දත්ත එහි ඇතුළත් කර තිබිය යුතුයි.)
5. ආචාර ධර්ම වලට අනුගත වෙමින් වගකීමෙන් හා නිවැරදිව ප්‍රතිජීවක භාවිතය සදහා සුදුසු ප්‍රචාරණ ක්‍රම පමණක් අනුගමනය කරන්න.
6. ප්‍රතිජීවක බෙදාහැරීම පිළිබද සවිස්තරාත්මක වාර්තා තබා ගන්න. (සපයන්නා, නිර්දේශ කරන්නා, කාණ්ඩ අංකය, භාවිත කරන්නා, නිෂ්පාදනයේ නම, ප්‍රමාණය වැනි)
7. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පශු ඖෂධ පාලන අධිකාරියට, ප්‍රතිජීවක බෙදාහැරීම හා භාවිතය පිළිබද දත්ත සැපයීම මඟින් සහයෝගය දක්වන්න.
8. ඔබගේ සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් අවශ්‍ය ප්‍රමාණයට සුදුසුකම් ලත් අය බව තහවුරු කරගන්න. ඔවුන්ට ප්‍රතිජීවක ගබඩා කිරීම, ප්‍රවාහනය, බැහැර කිරීම පිළිබද අවශ්‍ය පුහුණුව ලබා දෙන්න.



Funded by UK Government

WORLD ORGANISATION FOR ANIMAL HEALTH
Protecting animals, preserving our future